**මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතිය - 2014**

-----------------------------------------------------------------

මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2010 ජූනි 07 දින එළඹි අංක 2624 එස්ආර්අයි දරන ණය ගිවිසුමේ iv ව්‍යවස්ථාවේ 4.05 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------------

මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව එවකට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වර්තමානයේ මුදල් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. ණයගැණුම්කරුගේ මූල්‍ය අවකාශය හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධතියේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු. මිලියන 5,344.8 කට සමාන එජඩො මිලියන 40.8 ක් වන අතර, ඉන් රු. මිලියන 4,034.8 කට සමාන එජඩො මිලියන 30.8 ක් කාර්මික සහාය අපේක්ෂාවන් සඳහා එජඩො මිලියන 2 ක ප්‍රදානයක් සහිතව සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. 2010 මැයි 01 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර 2013 ඔක්තෝබර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ කාල පරිච්ඡේදය 2016 අප්‍රේල් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

1..3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය

විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම හඳුනා ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන
--------------------

2.1 මතය
-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව .

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

2.2 විගණන නිරීක්ෂණ
-------------------------

2.2.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
---------------------------------------------------------------------------------

2007 අප්‍රේල් 05 දිනැති අංක එම් එස් ඩී 33 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 4.2.1 ඡේදය හා 2009 අප්‍රේල් 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ දක්වා ඇති සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් රු. 195,000 ක වැටුප් ලබා ගෙන ඇතිබව නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණයගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2014වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ මුදල | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 30.80 | 4,034.80 | 1,000.00 | 1.25 | 164.00 | 6.00 | 799.00 |
| ශ්‍රී ලං ර | 10.00 | 1,310.00 | 65.00 | 0.43 | 56.00 | 1.30 | 171.00 |
| | 40.80 | 5,344.80 | 1,065.00 | 1.68 | 220.00 | 7.30 | 970.00 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව, 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් වර්ෂ 4 ක් ඉකුත්වීමෙන් පසුවත් ව්‍යාපෘතිය විසින් ණය මුදලෙන් සියයට 19.48 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) උපදේශක සේවා ප්‍රසම්පාදනය සඳහා කරන ලද රු මිලියන 471.6 ක සම්පූර්ණ වෙන් කිරීම 2014 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි.

3.2 භෞතික ප්‍රගතිය

-----------------

ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම හා ධාරිතා සංවර්ධනය යන ප්‍රධාන සංරචක දෙකකින් ව්‍යාපෘතිය සමන්විත වේ. 2014 දෙසැම්බර් 31 දිනට එම සංරචකවල භෞතික ප්‍රගතිය පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තොරතුරු පද්ධති යටිතල සැපයීම, ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය භාවිතය හා ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත්තුව 2013 ඔක්තෝබර් 14 දින විදේශ සමාගමකට ලබා දී තිබුණු අතර, ලෝකල් ඒරියා නෙට්වර්ක් (L A N) ස්ථාපිත කිරීම,පවත්නා ගිණුම්කරණ පද්ධතිය වැඩිදියුණු කිරීම, පද්ධති අවශ්‍යතා පිරිවිතරයන් වේගවත් කිරීම හා රේඛීය අමාත්‍යාංශවල කාර්ය භාරය පිළිබඳ වෙනස්කම් සිදුකිරීම ආදියෙහි ප්‍රමාදයන් හේතුවෙන් එහි භෞතික ප්‍රගතිය 2014 දෙසැම්බර් 31 දිනට මන්දගාමී තත්ත්වයක පැවතුණි.

(ආ) වැඩ සැලසුම් අනුව, දළ වශයෙන් භාවිතා කරන පාර්ශ්වයන් 5000 ක් ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳ පුහුණු කළ යුතුය. කෙසේවුවද පද්ධති ස්ථාපිත කිරීම පිළිබඳ ප්‍රමාදයන් හේතුවෙන් 2014 දෙසැම්බර් 31 වන විටත් එම කටයුතු ආරම්භ කර නොතිබුණි.

3.3 පරිබාහිර වියදම්

------------------

ව්‍යාපෘතිය විසින් දරන ලද රු 9,459,620 ක් වූ මුද්‍රණ ගාස්තු ව්‍යාපෘතියේ අරමුණු ඉටු කරගැනීම සඳහා සෘජුවම අදාළනොවූ බව නිරීක්ෂණය විය.

3.4 මූල්‍ය පාලන පිළිබඳ කරුණු

---------------------------------

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.